# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2065/38 - 2018 අප්‍රේල් මස 05 වැනි බ්‍රහස්පතින්දා - 2018.04.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 6/2017

### 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත

2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 11(1) (ආ), 17(2) සහ 31 (ඇ), (ඉ), (ඊ), (උ) සහ (ඌ) යන වගන්ති සමග කියවිය යුතු එකී පනතේ 117(2)(එ) වන වගන්තිය යටතේ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

නිමල් සිරිපාල ද සිල්වා,
ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍ය.

2018 අප්‍රේල් මස 02 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2018 අංක  දරන සිවිල් ගුවන් සේවා නිරුපද්‍රිතතා කළමනාකරණ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

**රාජ්‍ය නිරුපද්‍රිතතා වැඩසටහන**

2. (1) නිරුපද්‍රිත ගුවන් යානා මෙහෙයුම් කාර්යය සඳහා (මෙහි මින්මතු ''ජා.සි.ගු.ස.'' යනුවෙන් සඳහන් කරනු ලබන) ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ ප්‍රමිති ප්‍රකාර (මෙහි මින්මතු ''රා.නි.වැ.'' යනුවෙන් සඳහන් කරනු ලබන) රාජ්‍ය නිරුපද්‍රිතතා වැඩසටහනක් අධිකාරිය විසින් පිහිටුවා පවත්වාගෙන යා යුතු ය.

(2) (මෙහි මින්මතු ''නි.ක.ක්‍ර.'' යනුවෙන් සඳහන් කරනු ලබන) නිරුපද්‍රිතතා කළමනාකරණ ක්‍රමයක් සහිත බලපත්‍රලාභී සේවා සැපයුම්කරුවකුට තම කර්තව්‍යය සහ කාර්ය ඉටු කිරීමට අවසර ලබාදෙන, අවස්ථානුගත කරුණුවලට අදාළ නියමයන් රා.නි.වැ. යටතේ වන අධිකාරිය විසින් නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

(3) අධිකාරිය විසින් රා.නි.වැ. ට අදාළ මෙහෙයුම් නියම නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

(4) (මෙහි මින්මතු ''අධ්‍යක්ෂ ජනරාල්වරයා'' යනුවෙන් සඳහන් කරනු ලබන) සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා සතුව,

(අ) රාජ්‍ය නිරුපද්‍රිතතා ප්‍රතිපත්තිය, අරමුණු සහ සම්පත් ;
(ආ) රාජ්‍ය නිරුපද්‍රිතතා අවදානම් කළමනාකරනය ;
(ඇ) නිරුපද්‍රිතතාව පිළිබඳ රාජ්‍යයේ සහතික වීම ; සහ
(ඈ) රාජ්‍ය නිරුපද්‍රිතතා ප්‍රවර්ධනය,

ක්‍රියාත්මක කිරීමට සහ අධීක්ෂණය කිරීමට බලය තිබිය යුතු අතර රා.නි.වැ. ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා මෙහි I වන උපලේඛනයේ දක්වා ඇති පරිදි, ඉහත කරුණු සම්බන්ධයෙන් බලපත්‍ර දරන සේවා සැපයුම්කරුවකුට විධාන නිකුත් කරනු ලැබිය යුතු ය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**සේවා සැපයුම්කරුවකුගේ නිරුපද්‍රිතතා කළමනාකරණ ක්‍රමය**

3. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, රා.නි.වැ. බලාත්මක කිරීමේ සහ ඒ සඳහා සේවා සැපයුම්කරුවකුගේ අනුකූල වීම සහතික කිරීමේ කාර්යය සඳහා,

(අ) සේවා සැපයුම්කරුවකුට නිරුපද්‍රිතතා කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කර පවත්වා ගෙන යාමට නියම කිරීම ; සහ

(ආ) (නි.ක.ක්‍ර) යේ මෙහෙයුම් කලින් කලට අධීක්ෂණය කිරීම සහ සෝදිසි කිරීම,

කරනු ලැබිය යුතු ය.

4. නි.ක.ප. -

(අ) එකී සේවා සැපයුම්කරුගේ විශාලත්වය සහ එහි ගුවන් සේවා නිෂ්පාදන සහ සේවාවන්ගේ සංකීර්ණත්වය සමග අනුරූප විය යුතු ය ;

(ආ) සැපයිය යුතු හෝ සිදු කරනු ලැබිය යුතු සේවා හෝ මෙහෙයුම් වර්ගයට අදාළ ;

(ඇ) ක්‍රියාත්මක කිරීමේ සැලසුමක් ඇතුළත් ; සහ

(ඈ) ජා.සි.ගු.ස. විසින් දක්වන ලද නියම හෝ ප්‍රඥප්තියේ 19 වන ඇමුණුමෙහි දක්වා ඇති නියම සමග අනුකූල,

විය යුතු ය.

5. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් රා.නි.වැ. ඵලදායී ලෙස බලාත්මක කිරීම සඳහා ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති පිළිබඳ මාර්ගෝපදේශ සහ අත්පොත් සපයනු ලැබිය හැකි ය.

**දත්ත රැස්කිරීමේ සහ සකස් කිරීමේ පද්ධතිය**

6. (1) අධිකාරිය විසින් නිරුපද්‍රිතතා දත්ත සහ තොරතුරු ග්‍රහණය කිරීම, ගබඩා කිරීම සහ රැස්කිරීමේ අදහසින් සහ ඒවා විශ්ලේෂණය කිරීමේ අදහසින් නිරුපද්‍රිතතා දත්ත රැස්කිරීමේ සහ සකස් කිරීමේ පද්ධතියක් (SDCPS) ස්ථාපිත කර පවත්වාගෙන යා යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මෙහි II වන උපලේඛනයේ දක්වා ඇති පරිදි නිරුපද්‍රිතතා දත්ත රැස්කිරීමේ සහ සකස් කිරීමේ පද්ධතියක් (SDCPS) ක්‍රියාත්මක කිරීම සඳහා නියමයන් සහ කාර්ය පටිපාටිය නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

**අර්ථ නිරූපණය**

7. මේ නියෝගවල කාර්ය සඳහා -

''අධිකාරිය'' යන්නෙන්, 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය අදහස් වේ ;

''සේවා සැපයුම්කරු'' යන්නෙන්, 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 6 වන වගන්තිය යටතේ පත් කරන ලද සේවා සැපයුම්කරුවෙක් අදහස් වන අතර එයට නි.ක.ක්‍ර. ක්‍රියාත්මක කිරීමෙහි නිරතව සිටින බලපත්‍රලාභී ආයතනයක් ද ඇතුළත් වේ ;

''ප්‍රමිතීන්'' යන්නෙන්, ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා ප්‍රඥප්තියේ 37 වන වගන්තිය යටතේ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් සම්මත කරන ලද, සහ ශ්‍රී ලංකාව විසින් ප්‍රඥප්තියේ 38 වන වගන්තියේ ප්‍රතිවිරෝධයක් ගොනුකර හැකි ප්‍රමිති සහ ප්‍රඥප්තියේ 37 වන වගන්තිය යටතේ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් සම්මත කරන ලද සහ ශ්‍රී ලංකාවෙහි යථා පරිදි ක්‍රියාත්මක කර බලාත්මක කර ඇත්තාවූ නිර්දේශිත පරිචයන් ද අදහස් වේ.

8. 2014 ඔක්තෝබර් 3 වන දිනැති අංක 1882/49 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2014 අංක 01 දරන සිවිල් ගුවන් සේවා නිරුපද්‍රිතතා කළමනාකරණ නියෝග, ඒ යටතේ සිදු කරන ලද කිසිවකට අගතියක් නොවන පරිදි, මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

*I වන උපලේඛනය*

*රාජ්‍ය නිරුපද්‍රිතතා අවදානම් කළමනාකරණය*

**බලපත්‍ර නිකුත් කිරීමේ, සහතික නිකුත් කිරීමේ, බලය පැවරීමේ සහ අනුමත කිරීමේ වගකීම්**

අ. 1.19 වන ඇමුණුමේ අදාළ විධිවිධානවලට අනුකූලව ආයතනවලට අදාළ වන්නා වූ බලපත්‍ර නිකුත් කිරීම, සහතික නිකුත් කිරීම, බලය පැවරීම සහ අනුමත කිරීම පිළිබඳ වගකීම් පහත ආයතන සම්බන්ධයෙන් සපුරා ඇති බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමකට පත් විය යුතු ය.

(අ) ප්‍රඥප්තියේ I වන ඇමුණුමට අනුකූලව අනුමත කරන ලද පුහුණු සංවිධාන ;

(ආ) පිළිවෙලින් ප්‍රඥප්තියේ 6 වන ඇමුණුමේ, I වන කොටසට හෝ III වන කොටසේ, II වන වගන්තියට අනුකූලව ජාත්‍යන්තර වානිජ ගුවන් ප්‍රවාහන සේවා පැවැත්වීමට බලයලත් ගගන යාත්‍රා හෝ හෙලිකොප්ටර් මෙහෙයුම්කරුවන් ;

සටහන ෘ නඩත්තු කටයුතු 6 වන ඇමුණුමේ, I වන කොටසට අනුකූලව අනුමත නඩත්තු සංවිධානයක් විසින් සිදු නොකර, 6 වන ඇමුණුමේ I වන කොටස හෝ III වන කොටසේ, II වන වගන්තිය ප්‍රකාරව ඒ හා සමාන වැඩපිළිවෙළක් යටතේ සිදු කරන අවස්ථාවකදී, එම වැඩපිළිවෙළ ද මෙහෙයුම්කරුගේ නිරුපද්‍රිතතා කළමනාකරණ ක්‍රමයේ (SMS) විෂය පථයට ඇතුළත් කෙරෙනු ඇත.

(ඇ) පිළිවෙලින් 6 වන ඇමුණුමේ I කොටස හෝ III කොටසේ II වගන්තියට අනුකූලව ජාත්‍යන්තර වානිජ ගුවන් ප්‍රවාහනයෙහි නිරත ගගන යාත්‍රා හෝ හෙලිකොප්ටර් මෙහෙයුම්කරුවන්ට සේවා සපයන අනුමත නඩත්තු සංවිධාන ;

(ඈ) 8 වන ඇමුණුමට අනුකූලව ගුවන් යානා, එන්ජින් හෝ ප්‍රචාලක වර්ග සැලසුම් හෝ නිෂ්පාදනය කිරීමේ වගකීම දරන සංවිධාන ;

(ඉ) II වන ඇමුණුමට අනුකූල ගුවන් ගමන් සේවා (ATS) සපයන සැපයුම්කරුවන් ; සහ

(ඊ) 14 වන ඇමුණුමේ, I වන වෙළුමට අනුකූලව සහතික කරන ලද ගගන යාත්‍රාංගන මෙහෙයුම්කරුවන්.

අ. 2. සේවා සැපයුම්කරුවන් සහ මෙහෙයුම්කරුවන් විසින් ස්ථාපනය කරනු ලබන නිරුපද්‍රිතතා කාර්ය සාධන දර්ශක සහ ඉලක්ක අධ්‍යක්ෂ ජනරාල්ට පිළිගත හැකි තත්ත්වයේ පවතින බවට අධ්‍යක්ෂ ජනරාල් සහතික විය යුතු ය.

අ. 3. ශ්‍රී ලංකාව ලියාපදිංචි කිරීමේ රාජ්‍යය වන විට, 6 ඇමුණුමේ II වන කොටසේ 3 වන වගන්තියට අනුකූලව විශාල හෝ ටර්බෝජෙට් වර්ගයේ හෝ ගුවන් යානා මෙහෙයුම් සිදු කරන ජාත්‍යන්තර පොදු ගුවන් සේවා මෙහෙයුම්කරුවන් විසින් නිරුපද්‍රිතතා කළමනාකරණ ක්‍රමයක් (SMS) ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නිර්ණායක අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ස්ථාපනය කළ යුතු ය.

අ. 4. ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ගුවන්යානා සම්බන්ධයෙන් වන නිර්ණායකවලට නිරුපද්‍රිතතා කළමනාකරණ ක්‍රම සැකිල්ල සහ අධ්‍යක්ෂ ජනරාල් විසින් ප්‍රකාශයට පත් කරනු ලබන ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතිවල අඩංගු වන අංග ඇතුළත් විය යුතු ය.

සටහන - ජාත්‍යන්තර පොදු ගුවන් සේවා මෙහෙයුම්කරුවන් සඳහා නිරුපද්‍රිතතා කළමනාකරණ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමේ නිර්ණායක පිහිටුවීමට අදාළ මාර්ගෝපදේශ නිරුපද්‍රිතතා කළමනාකරණ සංග්‍රහයෙහි ඇතුළත් වී ඇත.

*අනතුරු සහ සිදුවීම් විමර්ශනය*

ශ්‍රී ලංකාවේ නිරුපද්‍රිතතා කළමනාකරණයට සහායක් වශයෙන් සම්මුතියේ 13 ඇමුණුමට අනුකූලව අනතුරු සහ සිදුවීම් විමර්ශනය කිරීම සඳහා ක්‍රියාවලියක් ස්ථාපනය කරනු ලැබිය යුතු ය.

*උවදුරු හඳුනා ගැනීම සහ නිරුපද්‍රිතතා අවදානම තක්සේරු කිරීම*

අ. 1. ජා.සි.ගු.ස. විසින් නිර්දේශ කරනු ලබන පරිදි, රැස්කරන ලද නිරුපද්‍රිතතා දත්ත ඇසුරින් උවදුරු හඳුනාගැනීමේ ක්‍රියාවලියක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ස්ථාපනය කරනු ලැබිය යුතු ය.

ආ. 2. හඳුනාගත් උවදුරු ආශ්‍රිත නිරුපද්‍රිතතා අවදානම තක්සේරු කිරීම සහතික කරන ක්‍රියාවලියක් අධ්‍යක්ෂ ජනාරාල් විසින් ස්ථාපනය කර පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

නිරුපද්‍රිතතා කළමනාකරණය

අධ්‍යක්ෂ ජනරාල් විසින් 19 ඇමුණුමේ අදාළ විධිවිධානවලට අනුකූලව නිරුපද්‍රිතතා ගැටලු විසඳීම සඳහා යාන්ත්‍රණ ස්ථාපනය කරනු ලැබිය යුතු ය.

අධ්‍යක්ෂ ජනරාල් විසින් නිරුපද්‍රිතතා අවදානම් කළමනාකරණය සඳහා සුදුසු ක්‍රියාවලියක් සකසා පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

1 වන සටහන - නිරුපද්‍රිතතා අවදානම් කළමනාකරණය සඳහා ගත යුතු ක්‍රියාමාර්ග අතරට බාර ගැනීම, අඩු කිරීම, වැළැක්වීම හෝ මාරු කිරීම ඇතුළත් විය හැකි ය.

2 වන සටහන - නිරුපද්‍රිතතා අවදානම් තත්ත්ව සහ නිරුපද්‍රිතතා ගැටලු තුළ නිරන්තරයෙන්ම සැලකිල්ලෙන් තක්සේරු කිරීම අවශ්‍ය වන සැඟවුණු සාධක පවතියි.

*නිරුපද්‍රිතතාව පිළිබඳ රාජ්‍යයේ සහතික වීම*

*සෝදිසිය පිළිබඳ වගකීම*

ඇ. 1. අ 1 ඡේදයෙහි සඳහන් කර ඇති ආයතනවල කාර්ය සාධනය සම්බන්ධයෙන් 19 වන ඇමුණුමෙහි අදාළ විධිවිධානවලට අනුකූලව සෝදිසිය පිළිබඳ වගකීම් සම්පූර්ණ කර ඇති බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමකට පත් විය යුතු ය.

සටහන : අ 1 ඡේදයේ සඳහන් කර ඇති ආයතන පිළිබඳව සෝදිසියේ දී නිරුපද්‍රිතතා කාර්ය සාධනය මෙන්ම ගුවන් සේවා නිෂ්පාදන සහ සේවාවල විශාලත්වය සහ සංකීර්ණත්වය ද සැලකිල්ලිට ගනු ලැබේ.

ඇ. 2. වැඩි නිරුපද්‍රිතතා සැලකිල්ලක් යෙදිය යුතු සහ අවශ්‍යතාවක් පවත්නා අංශ සම්බන්ධයෙන් පවත්වනු ලබන පරීක්ෂණ, විගණන සහ සමීක්ෂණ ප්‍රමුඛතාකරණය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කාර්ය පටිපාටි ස්ථාපනය කරනු ලැබිය යුතු ය.

සටහන : පරීක්ෂණ, විගණන සහ සමීක්ෂණ ප්‍රමුඛතාකරණය සඳහා, සංවිධානමය අවදානම් පැතිකඩ, උවදුරු හඳුනා ගැනීමේ දී සහ අවදානම් තක්සේරුවේ දී සොයාගත් කරුණු සහ සෝදිසි ප්‍රතිඵල මගින් තොරතුරු ලබාගත හැකි වේ.

ඇ. 3. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අ 1 ඡේදයේ සඳහන් කර ඇති ආයතනයක නිරුපද්‍රිතතා කාර්ය සාධනය කලින් කළ සමාලෝචනය කළ යුතු ය.

*රාජ්‍ය නිරුපද්‍රිතතා කාර්ය සාධනය*

ඇ. 1. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් රාජ්‍ය නිරුපද්‍රිතතා වැඩසටහන (රා.නි.වැ.) හරහා සාක්ෂාත් කර ගත යුතු පිළිගත හැකි නිරුපද්‍රිතතා කාර්ය සාධන මට්ටමක් ස්ථාපනය කරනු ලැබිය යුතු ය.

සටහන - දැනට පවතින නිරුපද්‍රිතතාවට සම්බන්ධ ප්‍රමිති සහ නිර්දේශිත පරිච (SARPS) (ප්‍ර.නි.ප) ක්‍රියාත්මක කිරීමේ පදනම මත නිරුපද්‍රිතතාව ඵලදායී ලෙස කළමනාකරණය කළ හැකි බවත් ගොඩනැගිය හැකි බවත් පෙන්නුම් කරමින් රා.නි.වැ. මෙන්ම නිරුපද්‍රිතතා කාර්ය සාධන දර්ශක සහ ඉලක්ක ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම මගින් ශ්‍රී ලංකාව සඳහා වන පිළිගත හැකි නිරුපද්‍රිතතා කාර්ය සාධන මට්ටමක් සාක්ෂාත් කරගත හැකි වනු ඇත.

ඇ 2. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, නිරුපද්‍රිතතා කළමනාකරණය සිදු කිරීම සහ නිරුපද්‍රිතතා ගැටලු විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගවල ඵලදායී බව ඇගයීම සඳහා ක්‍රියාවලියක් සකස් කර පවත්වාගෙන යා යුතු ය.

සටහන : නිරුපද්‍රිතතා අවදානම් කළමනාකරණය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග ප්‍රමුඛතාකරණයට සහාය වීම සඳහා නිරුපද්‍රිතතා තක්සේරුවෙන් ලැබෙන ප්‍රතිඵල භාවිත කරනු ලැබිය හැකි ය.

ඇ 3. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, නිරුපද්‍රිතතා කළමනාකරණ ක්‍රමයක් නිරුපද්‍රිතතා කාර්ය සාධනයෙහි සමස්ථ මට්ටම පවත්වාගෙන යාම සඳහා හෝ අඛණ්ඩව දියුණු කිරීම සඳහා නිරුපද්‍රිතතා කාර්ය සාධන ක්‍රමයේ ඵලදායීතාව ඇගයීමට ලක් කරනු ලැබිය යුතු ය.

*රාජ්‍ය නිරුපද්‍රිතතා ප්‍රවර්ධනය*

*අභ්‍යන්තර සන්නිවේදනය සහ නිරුපද්‍රිතතා තොරතුරු බෙදාහැරීම*

ඵලදායී රාජ්‍ය නිරුපද්‍රිතතා වැඩසටහනක් පෝෂණය කරනු ලබන ධනාත්මක නිරුපද්‍රිතතා චර්යාවක් ඇති කිරීමට සහාය වීම සඳහා, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් රාජ්‍යයේ ගුවන් සේවා සංවිධාන අතර නිරුපද්‍රිතතා දැනුවත්භාවය සහ නිරුපද්‍රිතතා තොරතුරු බෙදාගැනීම සහ හුවමාරු කිරීම ප්‍රවර්ධනය කරනු ලැබිය යුතු ය.

*බාහිර සන්නිවේදන සහ නිරුපද්‍රිතතා තොරතුරු පැතිරවීම.*

නිරුපද්‍රිතතාවය පවත්වාගෙන යාම සහ වර්ධනය කිරීම පෝෂණය කිරීමට සහ ධනාත්මක නිරුපද්‍රිතතා චර්යාවක් ගොඩනැගීම සඳහා සහාය වීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිරුපද්‍රිතතා දැනුවත්භාවය සහ ගුවන් සේවා ප්‍රජාව සමග නිරුපද්‍රිතතා තොරතුරු බෙදාගැනීම සහ හුවමාරු කර ගැනීම ප්‍රවර්ධනය කරනු ලැබිය යුතු ය.

සටහන : ගුවන් සේවා ප්‍රජාවට ප්‍රවේශ විය හැකි නිරුපද්‍රිතතා පුහුණු අවස්ථා හඳුනාගැනීම නිරුපද්‍රිතතා දැනුවත්භාවය ප්‍රවර්ධනය කිරීමේ කාර්යයට ඇතුළත් විය හැකි ය.

මේ නියෝගයෙහි කාර්යයන් සඳහා -

''1 වන ඇමුණුම'' යන්නෙන්, ප්‍රඥප්තියෙහි පුද්ගල බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් 1 වන ඇමුණුමෙහි වර්තමාන සංස්කරණය අදහස් වේ ;

''6 වන ඇමුණුම'' යන්නෙන්, ප්‍රඥප්තියෙහි ගුවන් යානා මෙහෙයුම් සම්බන්ධයෙන් වන 6 වන ඇමුණුමෙහි වර්තමාන සංස්කරණය අදහස් වේ ;

''8 වන ඇමුණුම'' යන්නෙන්, ප්‍රඥප්තියෙහි ගුවන් යානා ගුවන් යෝග්‍යතාවය සම්බන්ධයෙන් වන 8 වන ඇමුණුමෙහි වර්තමාන සංස්කරණය අදහස් වේ ;

''14 වන ඇමුණුම'' යන්නෙන්, ප්‍රඥප්තියෙහි ගගන යාත්‍රාංගන සම්බන්ධයෙන් වන 14 වන ඇමුණුමෙහි වර්තමාන සංස්කරණය අදහස් වේ ;

''19 වන ඇමුණුම'' යන්නෙන්, ප්‍රඥප්තියෙහි නිරුපද්‍රිතතා කළමනාකරණය සම්බන්ධයෙන් වන 19 වන ඇමුණුමෙහි වර්තමාන සංස්කරණය අදහස් වේ.

## *II වන උපලේඛනය*

*නිරුපද්‍රිතතා දත්ත, නිරුපද්‍රිතතා තොරතුරු රැස්කිරීම, විශ්ලේෂණය, ආරක්ෂා කිරීම, බෙදා ගැනීම සහ හුවමාරු කර ගැනීම.*

අ. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිරුපද්‍රිතතා දත්ත සහ නිරුපද්‍රිතතා තොරතුරු ග්‍රහණය කිරීම, ගබඩා කිරීම සහ ඒකරාශි කිරීම සඳහා සහ එම දත්ත සහ තොරතුරු විශ්ලේෂණය කළ හැකි තත්ත්වයට පත් කිරීම සඳහා (මෙහි මින් මතු නි.ද.රැ.ස.ප. යනුවෙන් සඳහන් කරනු ලබන, නිරුපද්‍රිතතා දත්ත රැස්කිරීමේ සහ සකස් කිරීමේ පද්ධති ස්ථාපනය කරනු ලැබිය යුතු ය.

1 වන සටහන - සකස් කිරීමේ සහ වාර්තා කිරීමේ ක්‍රම, නිරුපද්‍රිතතා දත්ත මූලාශ්‍ර, තොරතුරු හුවමාරු කර ගැනීමේ ක්‍රම සහ පහත සඳහන් දෑ ඇතුළත් එහෙත් ඊට සීමා නොවන වාර්තාගත කරන ලද තොරතුරු නි.ද.රැ.ස.ප. වශයෙන් හැඳින්වේ.

(අ) අනතුරු සහ සිදුවීම් විමර්ශනයට අදාළ දත්ත සහ තොරතුරු ;

(ආ) රාජ්‍ය බලධාරීන් විසින් හෝ සේවා සැපයුම්කරුවන් විසින් හෝ පවත්වන ලද නිරුපද්‍රිතතා විමර්ශනවලට අදාළ දත්ත සහ තොරතුරු ;

(ඇ) ''ආ'' හි සඳහන් අනිවාර්ය නිරුපද්‍රිතතා වාර්තාකරණ ක්‍රම ;

(ඈ) ''ඇ'' හි සඳහන් ස්වේච්ඡා නිරුපද්‍රිතතා වාර්තාකරණ ක්‍රම ; සහ

(ඉ) 6 ඇමුණුමේ 1 වන කොටසේ - 3 වන පරිච්ඡේදයේ විස්තර කර ඇති ස්වයංක්‍රීය දත්ත ග්‍රහණ පද්ධති ඇතුළු ස්වයං හෙළදරව් වාර්තාකරන ක්‍රම සහ ස්වයංක්‍රීයව නොවන දත්ත ග්‍රහණය කිරීමේ ක්‍රම :

එසේ වුව ද, එම දත්ත හෝ තොරතුරු හුවමාරු කිරීම හෝ බෙදා හැරීම 13 වන ඇමුණුම යටතේ තහනම් කර නොමැත.

2 වන සටහන - ''නිරුපද්‍රිතතා දත්ත මූලාශ්‍රය'' යන යෙදුමෙන් තනි දත්ත මූලාශ්‍රයක් හෝ බහු ආංගික දත්ත මූලාශ්‍රයක් හැඳින්වේ.

3 වන සටහන - රාජ්‍ය, කර්මාන්ත හෝ මහජන ප්‍රභවයන්ගෙන් ලැබෙන දත්ත නි.ද.ර.ස.ප. හි ඇතුළත් විය හැකි අතර එය නිරුපද්‍රිතතා දත්ත සහ නිරුපද්‍රිතතා තොරතුරු රැස්කිරීමේ ප්‍රතික්‍රියා කාරක හෝ පූර්ව ක්‍රියාකාරී ක්‍රම මත පදනම් විය හැකි ය.

4 වන සටහන - අංශ විශේෂිත නිරුපද්‍රිතතා වාර්තාකරන විධිවිධාන වෙනත් ඇමුණුම් තුළ සහ ගුවන් සංතරණ සේවා කාර්ය පටිපාටි සහ කලාපීය පරිපූරක කාර්ය පටිපාටි තුළ සඳහන් වී ඇත. සියලුම ප්‍රභවයන්ගෙන් නිරුපද්‍රිතතා දත්ත සහ නිරුපද්‍රිතතා තොරතුරු රැස් කිරීම සහ විශ්ලේෂණය කිරීම සඳහා සමෝධානික ගිවිසුමක් තිබීමෙන් රා.නි.වැ. ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා සැලසෙන පිළිගත් වාසි ඇත.

ආ. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සිදුවීම් වාර්තාකරණය ද ඇතුළත් වන අනිවාර්ය නිරුපද්‍රිතතා වාර්තාකරණ ක්‍රමයක් ස්ථාපනය කරනු ලැබිය යුතු ය.

ඇ. අනිවාර්ය නිරුපද්‍රිතතා වාර්තාකරණ ක්‍රම මගින් ග්‍රහණය කර නොහැකි නිරුපද්‍රිතතා දත්ත සහ නිරුපද්‍රිතතා තොරතුරු රැස්කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ස්වේච්ඡා නිරුපද්‍රිතතා වාර්තාකරණ ක්‍රමයක් ස්ථාපනය කරනු ලැබිය යුතු ය.

ඈ. ශ්‍රී ලංකාවේ ගුවන් යානා අනතුරු විමර්ශන කාර්යාංශය ඇතුළු අධ්‍යක්ෂ ජනරාල්වරයාට 19 වන ඇමුණුමේ මූලධර්මයන්ට අනුකූලව ඔහුගේ නිරුපද්‍රිතතා වගකීම් ඉටු කිරීමට SDCPS වෙත පිවිසීමේ බලය තිබිය යුතු ය.

ඉ. නිරුපද්‍රිතතා තොරතුරු බෙදා ගැනීම සහ හුවමාරු කර ගැනීම පහසු කිරීම සඳහා දත්ත මූලාශ්‍රයෙහි ප්‍රමිති කළ වර්ගීකරණයක් භාවිත කළ යුතු ය.

සටහන - ADREP - අනුකූල පද්ධතියක් භාවිත කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා උනන්දු කරවනු ලැබේ.

*නිරුපද්‍රිතතා දත්ත සහ නිරුපද්‍රිතතා තොරතුරු විශ්ලේෂණය*

අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් SDCPS සහ ආශ්‍රිත නිරුපද්‍රිතතා දත්ත මූලාශ්‍ර වෙතින් ලබා ගන්නා නිරුපද්‍රිතතා දත්ත සහ නිරුපද්‍රිතතා තොරතුරු විශ්ලේෂණය කිරීමේ ක්‍රියාවලියක් ස්ථාපනය කර පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

1 වන සටහන - අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සිදු කරනු ලබන නිරුපද්‍රිතතා දත්ත සහ නිරුපද්‍රිතතා තොරතුරු විශ්ලේෂණයෙහි අරමුණ වනුයේ තනි සේවා සැපයුම්කරුවන්ගේ සහ මෙහෙයුම්කරුවන්ගේ නිරුපද්‍රිතතා දත්ත විශ්ලේෂණ ක්‍රියාවලි මගින් හඳුනාගැනීමට නොහැකි විය හැකි පද්ධතිමය සහ හරස්කැපුම් උවදුරු හඳුනාගැනීමය.

2 වන සටහන - මෙම ක්‍රියාවලියට නිරුපද්‍රිතතා දත්ත විශ්ලේෂණය කිරීමේ පෙර නිමිති පළ කිරීමේ ක්‍රම ද ඇතුළත් විය හැකි ය.

*නිරුපද්‍රිතතා දත්ත සහ නිරුපද්‍රිතතා තොරතුරු ආරක්ෂා කිරීම*

අ 1. අධිකාරිය විසින් 19 වන ඇමුණුමට අනුකූලව ස්වේච්ඡා නිරුපද්‍රිතතා වාරතාකරණ ක්‍රම සහ ආශ්‍රිත ප්‍රභවයන් මගින් ග්‍රහණය කරනු ලබන නිරුපද්‍රිතතා දත්ත සහ එකී ක්‍රම තුළින් ව්‍යුත්පන්න කරගනු ලබන නිරුපද්‍රිතතා තොරතුරු සඳහා ආරක්ෂාව ලබා දිය යුතු ය.

සටහන : ප්‍රභවයන් යන්නට තනි පුද්ගලයෙක් සහ සංවිධාන ද ඇතුළත් වේ.

අ 2. අධිකාරිය විසින් අනිවාර්ය නිරුපද්‍රිතතා වාර්තාකරණ ක්‍රම සහ ආශ්‍රිත ප්‍රභවයන් මගින් ග්‍රහණය කරනු ලබන නිරුපද්‍රිතතා දත්ත සහ එකී ක්‍රම තුළින් ව්‍යුත්පන්න කරගනු ලබන නිරුපද්‍රිතතා තොරතුරු සඳහා ද ඉහත කී ආරක්ෂාව විස්තීරණය කළ යුතු ය.

සටහන : තමන්ගේ පුහුණුවට සහ පළපුරුද්දට අනුරූප වන පරිදි ඉටු කරනු ලබන කාර්ය සහ නොකර හැරීම සඳහා දඬුවම් විඳීමට සිදු නොවන බවට සේවකයින් සහ මෙහෙයුම් පුද්ගලයන් අතර විශ්වාසයක් ගොඩනැගෙන වාර්තාකරන පරිසරයක් නිරුපද්‍රිතතා වාර්තාකරණයට මූලික වේ.

අ 3. නිරුපද්‍රිතතාව පවත්වාගෙන යාම හෝ වර්ධනය කිරීම සඳහා හැර වෙනත් කාර්යයන් සඳහා අ සහ ආ ඡේදයට, අනුකූලව රැස්කරන ලද, ගබඩා කරන ලද හෝ විශ්ලේෂණය කරන ලද නිරුපද්‍රිතතා දත්ත හෝ නිරුපද්‍රිතතා තොරතුරු, ව්‍යතිරේඛ මූලධර්මයක් අදාළ වන බවට නිසි බලධාරියා විසින් නිශ්චය කරනු ලබන්නේ නම් මිස ලබා දීම හෝ භාවිත කිරීම සිදු නොකරනු ලැබිය යුතු ය.

අ 4. ඇ ඡේදය නොසලකමින්, ගුවන් සේවා නිරුපද්‍රිතතාව පවත්වාගෙන යාම හෝ වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය වන නිවැරදි කිරීමේ හෝ ප්‍රතිකර්ම සැලසීමේ ක්‍රියාමාර්ගයක් ගැනීමෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා නොවැළැක්විය යුතු ය.

අ 5. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, ආ සහ ඇ ඡේදයන්හි සඳහන් ක්‍රම හරහා සිදු කරනු ලබන නිරුපද්‍රිතතා වාර්තාකරණය දිරිමත් කිරීම සඳහා ධනාත්මක නිරුපද්‍රිතතා චර්යාවක් ප්‍රවර්ධනය කිරීම ද ඇතුළු අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු ය.

අ 6. ඇ ඡේදයේ සඳහන් තීරණයට සහායක් වශයෙන් අධිකාරිය විසින් 19 වන ඇමුණුමේ සඳහන් පරිදි ගුවන් සේවා නිරුපද්‍රිතතාව බාරව ඇති සහ යුක්තිය පසිඳලීමේ කාර්යය බාරව ඇති රාජ්‍ය ආයතන අතර උචිත පූර්ව සැලසුම් ඇති කර භාවිත කරනු ලැබිය යුතු ය.

*නිරුපද්‍රිතතා තොරතුරු බෙදා ගැනීම සහ හුවමාරු කර ගැනීම*

ආ 1. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් SDCPS හි අඩංගු තොරතුරු විශ්ලේෂණය කිරීමේ දී වෙනත් රාජ්‍යයන්ට වැදගත් වේ යයි අදහස් කරන නිරුපද්‍රිතතා කරුණු හඳුනාගතහොත්, 13 වන ඇමුණුම යටතේ එම දත්ත සහ තොරතුරු හුවමාරු කර ගැනීම හෝ බෙදා හැරීම තහනම් කර නොමැති අවස්ථාවල දී පමණක්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එකී තොරතුරු හැකි ඉක්මණින් ඔවුන් වෙත යැවිය යුතු ය. එම තොරතුරු බෙදා ගැනීමට පෙර, අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ අදාළ රාජ්‍ය විසින් ආරක්‍ෂාවේ මට්ටම සහ නිරුපද්‍රිතතා තොරතුරු බෙදා ගැනීමේ කොන්දේසි සම්බන්ධයෙන් එකඟ විය යුතු ය. ආරක්ෂාවේ මට්ටම සහ කොන්දේසි 19 වන ඇමුණුමේ සඳහන් ආකාරයට විය යුතු ය.

ආ 2. ජාතික නීතියෙන් වෙනත් ආකාරයකට විධිවිධාන සලසා ඇත්නම් මිස, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ගුවන් සේවා පද්ධතිය භාවිත කරන්නන් අතර නිරුපද්‍රිතතා තොරතුරු බෙදා ගැනීමේ සහ හුවමාරු කර ගැනීමේ ජාල ස්ථාපනය කිරීම ප්‍රවර්ධනය කළ යුතු අතර එසේ නිරුපද්‍රිතතා තොරතුරු බෙදා ගැනීම සහ හුවමාරු කර ගැනීමට පහසුකම් සැලැස්විය යුතු ය.

මේ උපලේඛනයේ කාර්යයන් සඳහා -

''අ.සි.ද.වා'' යන්නෙන්, අනතුරු සහ සිදුවීම් දත්ත වාර්තාකරණය අදහස් වේ ;

''6 වන ඇමුණුම'' යන්නෙන්, ප්‍රඥප්තියේ ගුවන් යානා මෙහෙයුම් සම්බන්ධයෙන් වන 6 වන ඇමුණුමෙහි වර්තමාන සංස්කරණය අදහස් වේ ;

''13 වන ඇමුණුම'' යන්නෙන්, ප්‍රඥප්තියේ ගුවන් යානා අනතුරු සහ සිදුවීම් විමර්ශනය සම්බන්ධයෙන් වන 13 වන ඇමුණුමෙහි වර්තමාන සංස්කරණය අදහස් වේ ;

''19 වන ඇමුණුම'' යන්නෙන්, ප්‍රඥප්තියේ නිරුපද්‍රිතතා කළමනාකරනය සම්බන්ධයෙන් වන 19 වන ඇමුණුමෙහි වර්තමාන සංස්කරණය අදහස් වේ ;

''ගු.ස.සේ.කා.'' යන්නෙන්, ගුවන් සංතරණ සේවා කාර්ය පටිපාටි අදහස් වේ ;

''ක.ප.කා.ප.'' යන්නෙන්, කලාපීය පරිපූරක කාර්යපටිපාටි අදහස් වේ.

04 - 710

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.